# අන්තර්ජාලයෙන් විකුණන සින්දු

අනාගතයේදී අන්තර්ජාලය හරහා ගීත විකිණීමට ටයිම් වෝර්නර් සමාගම හා EMI සමාගම සැලසුම් කොට තිබෙනවා. මෙහිදී MP3 නම් පරිගණක ආශ්‍රිත නව තාක්ෂණික උපක්‍රමයක් භාවිත කරනු ලබන අතර ගීත එම තාක්ෂණයට අනුව අන්තර්ජාලයට එක් කරනු ලබයි. අනතුරුව අන්තර්ජාලය හරහා මෙම ගීත සංයුක්ත තැටිවලට ගොනු කොට ගත හැකි යි.



**1** සංගීත සමාගම් තමන්ගේ ගීත MP3 තාක්ෂණයට පෙරළනු ලැබීමේ දී අන්තර්ජාලයේ මෙගාබයිට් 50 ක "ඉඩක්" අවශ්‍ය වන අතර MP3 ග්‍රාහකයින්ට ඒ සඳහා අවශ්‍ය වන්නේ මෙගාබයිට් 5 ක තැටියක්

MP3 ලබාගත හැකි පරිගණක වැඩසටහන වන Sound Jam වැඩසටහනට අනුව පරිගණක තිරයේ දිස්වන්නේ සාමාන්‍ය ගීත තැටි ධාවන යන්ත්‍රයක උපාංගයි




**2** අන්තර්ජාලය හා සම්බන්ධ පරිගණකයකට ගීත ගොනු වක් රැස්කොට ගැනීමට ගත වන්නේ මිනිත්තු 15 ක්



**3** මින් අනුතරුව ගීතය ලබාගත් තැනැත්ත ට **Sound Jam** වැනි **MP3** වර්ගයේ පරිගණක වැඩසටහනක් භාවිතයෙන් ගීත ඇසිය හැකි යි.



**4** මෙලෙසින්ම සමහර ගීත තැටි සාමාන්‍ය පරිගණක ආශ්‍රයෙන් MP3 ගොණු බවට පත් කළ හැකි යි



**5** ඉතින් මේ අනුව MP3 ධාවන යන්ත්‍ර (ඒ කියන්නේ පරිගණක) වලින් සාමාන්‍ය ගීත තැටි ද ඇසිය හැකි යි

රොයිටර් ඇසුරිනි

**සකස් කළේ :- පාලිත අමරසූරිය**